# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 33 දරන
# පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත

---

[සහතිකය සටහන් කළේ 1992 ජූලි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 ජූලි මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 3.10 යි.

# 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත

[සහතිකය සටහන් කළේ 1992 ජූලි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 41/90.

**ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණ කිරීම, පතල් කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම විධිමත් කිරීම පිණිස භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය පිහිටුවීම සඳහා ද; භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය එම කාර්යාංශය වෙත පැවරීම සඳහා ද, (211 වන අධිකාරය වූ) ලුණු ආඥාපනත, 1968 අංක 46 දරන විකිරණශීලී ඛනිජ වස්තු පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය පිහිටුවීම, එහි බලතල හා කර්තව්‍ය.

2. (1) (මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු, කාර්යාංශයක් පිහිටුවනු ලැබිය යුතු ය.

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය පිහිටුවීම.

(2) කාර්යාංශය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති, සංස්ථාවක් විය යුතු අතර, කාර්යාංශය විසින් එහි සංස්ථා නාමයෙන් නඩු පැවරීම ද, ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. කාර්යාංශයේ කටයුතු පිළිබඳ පරිපාලනය හා කළමනාකරණය, 4 වන වගන්තියෙහි විධිවිධාන සළසා ඇති ආකාරයට පත් කරනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, ඒ කාර්යය සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් කාර්යාංශයේ සියලු බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය.

4. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන), කළමනාකරණ මණ්ඩලය, පහත සඳහන් සාමාජිකයන් පස් දෙනාගෙන් සමන්විත විය යුතු ය:—

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ.

(අ) භූ විද්‍යාව, පතල් කැනීම හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව දැනීමක් ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනෙක්;

9—ඩී 022474—5,780 (92/04)

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඇ) 6 වන වගන්තිය යටතේ පත් කරනු ලබන භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් අධ්‍යක්ෂවරයා.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වන්නේ නම් නැතහොත් එබඳු මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වූව හොත්, ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකුට රෝගාතුරවීම, අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කෙරෙහි සැළකිලිමත්ව ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඉවත් කිරීම සඳහා කිසිදු හේතුවක් නොදක්වා, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ එවැනි යම් සාමාජිකයකු ඉවත් කිරීම, කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, මණ්ඩලයේ සාමාජිකයකුට මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුර කාලය, අවුරුදු තුනක් විය යුතු ය :

එසේ වුව ද, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරන හෝ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(8) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයන් අතුරින්, අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ සභාපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(ආ) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට, සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(ඈ) මේ උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහු සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

සභාපතිවරයා සහ කටයුතු කරගෙන යාම.

5. (1) සභාපතිවරයා ඔහු පැමිණ සිටින, මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ කිසියම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් වෙනත් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ පනතේ වෙනත් විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවකට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය, මණ්ඩලය විසින් විධිමත් කරගනු ලැබිය හැකි ය.

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් අධ්‍යක්ෂවරයා

6. (1) භූ විද්‍යාඥයකු ලෙස හෝ පතල් ඉංජිනේරුවරයකු ලෙස හෝ යටත් පිරිසෙයින් අවුරුදු දහයක වෘත්තීය පළපුරුද්දක් සහ වෙනත් නියමිත සුදුසුකම් ඇති තැනැත්තකු, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් අධ්‍යක්ෂවරයා වශයෙන් අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විමසා පත් කරනු ලැබිය යුතු ය.

(2) (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් අධ්‍යක්ෂවරයා, කාර්යාංශයේ ප්‍රධාන තාක්ෂණ නිලධරයා විය යුතු අතර, ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාන්‍ය විධානයට යටත්ව, භූ විද්‍යා සමීක්ෂණ පැවැත්වීම, සහ මේ පනත පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

(3) තම පත්වීමේ දිනයෙහි සිට අවුරුදු හයක කාලයක් සඳහා අධ්‍යක්ෂවරයා ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුව ද, වයස අවුරුදු හැටකට එළඹුණු විට අධ්‍යක්ෂවරයා ධුරයෙන් විශ්‍රාම ගත යුතු ය.

(4) අධ්‍යක්ෂවරයාගේ සේවා නියම හා කොන්දේසි, කාර්යාංශය සමඟ එළඹෙන සේවා ගිවිසුමෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(5) යහපත් සහ ප්‍රමාණවත් හේතුවක් සඳහා හැර, අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලයට ක්‍රියා කළ හැකි බව.

7. මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි කවර හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත වේයැයි සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල පැවරීම.

8. (1) මේ උපවගන්තියෙන් පවරා ඇති බලය හැර, මේ පනතින් කාර්යාංශය වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කරදී ඇති බලතල කිසිවක් හෝ බලතල සියල්ල ම, මණ්ඩලය විසින් සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ කාර්යාංශයේ සේවා නියුක්තයකු හෝ වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල කිසිවක් පවරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, ඒ සෑම තැනැත්තකු ම, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ හෝ විධානවලට යටත්ව ඒ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

කාර්යාංශය විසින් ඇති කර ගනු ලැබීමට යෝජිත යම් ව්‍යාපෘතියක්, ව්‍යාපාරයක් හෝ ගිවිසුමක් පිළිබඳව ඇති සම්බන්ධතාව මණ්ඩලයේ සාමාජිකයන් විසින් හෙළිදරව් කරනු ලැබිය යුතු බව.

9. (1) කාර්යාංශය විසින් ඇති කර ගන්නා ලද නැතහොත් ඇති කර ගනු ලැබීමට යෝජිත යම් ව්‍යාපෘතියකට, ව්‍යාපාරයකට හෝ ගිවිසුමකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කෙළින්ම හෝ නොඑසේව සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ සාමාජිකයකු විසින්, තම සම්බන්ධතාවේ ස්වභාවය, හැකි මුල්ම අවස්ථාවේදී ම මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කරනු ලැබිය යුතු ය. එම හෙළිදරව් කිරීම, මණ්ඩලයේ වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින්, අන්‍යාකාරයකින් විධාන කරනු ලැබුවහොත් මිස, ඒ සාමාජිකයා ඒ ව්‍යාපෘතිය, ව්‍යාපාරය හෝ ගිවිසුම පිළිබඳ වූ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට හෝ සහභාගි නොවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

10. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා යම් ප්‍රමාණ අනුව මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට හෝ ඔවුන්ගෙන් කිසිවකුට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

කාර්යාංශයේ මුද්‍රාව.

11. (1) කාර්යාංශයේ මුද්‍රාව සභාපතිවරයා භාරයෙහි තිබිය යුතු ය.

(2) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනාම තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය.

කාර්යාංශයෙහි කර්තව්‍ය.

12. කාර්යාංශයෙහි කර්තව්‍ය—

(අ) ශ්‍රී ලංකාවෙහි ක්‍රමවත් භූ විද්‍යා සිතියම් සැකසීම භාර ගැනීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ ඒවා තක්සේරු කිරීම ;

(ඈ) ඒ ඛනිජ සඳහා පතල් කැනීමේ වාණිජමය ස්වශක්තිතාව පිළිබඳව අගැයීම සහ ඛනිජ සකස් කිරීම හා අපනයනය කිරීම ;

(ඇ) ඒ ඛනිජ සඳහා ගවේෂණ කිරීම හා පතල් කැනීම සහ ඒ ඛනිජ සකස් කිරීම, වෙළෙඳාම හා අපනයනය කිරීම, බලපත්‍ර නිකුත් කිරීම මගින් විධිමත් කිරීම ;

(ඉ) වාණිජමය පදනමක් මත, ඛනිජ නිෂ්කර්ෂණය කිරීම සහ නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම

විය යුතු ය.

කාර්යාංශයේ බලතල.

13. (1) කාර්යාංශයේ කර්තව්‍ය භාරගෙන යාම පිණිස, අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වන කවර හෝ දෙයක් කිරීමේ බලය, කාර්යාංශයට තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව කාර්යාංශයට—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමේ, ඇරීමේ, බද්දට නැතහොත් කුලියට ගැනීමේ හෝ දීමේ, උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ ;

(ආ) එහි බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිණිස සහ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය ගිවිසුම් කිසිවකට ඇතුළත් වීමේ ;

(ඇ) එහි නිලධරයන් හා සේවකයන් පත් කිරීමේ, ඔවුන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීමේ සහ ඔවුන් පාලනය කිරීමේ ;

(ඈ) ඛනිජ සඳහා ගවේෂණ කිරීම, පතල් කැනීම, ඛනිජ සකස් කිරීම, ප්‍රවාහනය කිරීම, වෙළෙඳාම හා ආනයනය කිරීම පිණිස බලපත්‍ර නිකුත් කිරීමේ ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වසා ඇමීමේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමතය මත කාර්යාංශය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් හා යම් ඇපයක් මත කාර්යාංශයේ කාර්‍ය සඳහා මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ;

(ඊ) කාර්යාංශය විසින සලසනු ලබන සේවා හෝ පහසුකම් හෝ කිසිවක් සඳහා ගාස්තු අය කිරීමේ ;

(ඩ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීමේ; සහ

(ඪ) පුහුණු කිරීමේ වැඩ සටහන් පවත්වා ගෙන යාමේ සහ සාමාන්‍යයෙන් කාර්යාංශයේ මතය අනුව නිසි පරිදි එහි කර්තව්‍ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පහසු කිරීම පිණිස අවශ්‍ය වන, වෙනත් සියලු දේ කිරීමේ

බලය තිබිය යුතු ය.

**රජයේ නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට සීමා කිරීම**

**14.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව, නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කිරීම හෝ එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) රජයේ නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක—

(අ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවේ දී, රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශිත තනතුරක් වූයේ නම්—

(i) ඔහු කාර්යාංශයේ සේවයෙහි නියුක්තව සිටින කාලය තුළ දී, පොදු ප්‍රතිපත්තිමය හේතු මත දෙනු ලැබූ වැටුප් රහිත නිවාඩු පිට රාජ්‍ය සේවයේ රාජකාරිවලින් බැහැරව සිටි ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ ව්‍යවස්ථා සංග්‍රහයේ 10 (1) වන වගන්තිය ඔහු කෙරෙහි අදාළ විය යුතු ය;

(ii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවිය යුතු වන වැටුපෙන් සියයට විසිපහක් නොඉක්මවන මුදලක්, ඔහු කාර්යාංශයේ සේවයෙහි නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් සඳහා ම මණ්ඩලය විසින්, ඔහු සම්බන්ධයෙන් කාර්යාංශයේ අරමුදලින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ගෙවනු ලැබිය යුතු ය; තව ද

(ආ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවේ දී ඔහු, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලෙහි දායකයකුව සිටියේ නම්, කාර්යාංශය වෙත කරනු ලබන ඔහුගේ සේවය, ඒ ආඥාපනතේ කාර්යය සඳහා ආණ්ඩුව වෙත කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඔහු කාර්යාංශයේ සේවයෙහි නියුක්තව සිටින කාලය තුළ දී, ඒ ආඥාපනත්

යටතේ ඔහු ගෙවීමට බැඳී සිටින යම් දායක මුදල්, ඔහු විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට නොකඩවා ගෙවනු ලැබිය යුතු ය. තව ද ඔහු සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට බැඳී සිටින දායක මුදලට සමාන මුදලක්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලෙහි අදාළ ගිණුමට බැර කිරීම සඳහා කාර්‍යාංශය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී කාර්යාංශයේ අරමුදලින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත, බැර කරනු ලැබිය යුතු ය.

(3) යම් රාජ්‍ය නිලධරයකු, කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් ඉවත් වී ඇතැයි සලකනු ලැබිය යුතු ය ;

(ආ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර ලෙස පත් කරනු ලැබූ අවස්ථාවේ දී රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශිත තනතුරක් වූයේ නම්,—

(i) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර ලෙස පත් කරනු ලැබූ දිනයෙහි ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබ තිබුණේ නම්, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට පිරිනැමිය හැකිව තිබුණු ප්‍රදානයක් ලැබීමට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය ; තව ද

(ii) ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ පිරිනමනු ලැබූ එවැනි යම් ප්‍රදානයක මුදල, කාර්යාංශයේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය, වයස හෝ අයහපත් සෞඛ්‍යය හෝ මත විශ්‍රාම යාම හෝ ඒ කාර්ය මණ්ඩලයේ ඔහු විසින් දරන ලද තනතුර අහෝසි කිරීම හේතු කොට ගෙන හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ අවසන් කරනු ලැබුවහොත් මිස, ඔහු වෙත ගෙවනු නොලැබිය යුතු ය ; තව ද

(iii) කාර්යාංශයේ සේවයෙහි නියුක්තව සිටිය දී ඔහුගේ මරණය සිදු වුවහොත්, කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිරව පත් කරනු ලැබීමට පෙරාතුව ම ඔහු මිය ගියේ නම්, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙනුවෙන් පිරිනැමිය හැකිව තිබුණු යම් ප්‍රදානයක්, ඔහු වෙනුවෙන් පිරිනමනු ලැබිය හැකි ය ; තව ද

(ඇ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර ලෙස පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකයකුව සිටියේ නම්, ඔහු

සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ඔහුගේ ගිවිසුම අවසන් කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වී ඇති ලෙස, ඒ ආඥාපනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින තැනැත්තකු කාර්යාංශය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් කාර්යාංශය සඳහා සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුව වෙත කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් හෝ පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ යම් නියම හා කොන්දේසි ද ඇතුළුව, මණ්ඩලය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟත්වයට එළඹෙන නියම හා කොන්දේසි මත, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර, යම් තැනැත්තකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

(7) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිව පත් කරනු ලැබිය හැකි ය ; නැත හොත් විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් හෝ පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ යම් කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය හා ඒ ප්‍රධාන විධායක නිලධරයා එකඟත්වයට එළඹෙන කොන්දේසි මත, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු ද යටත් විය යුතු ය.

(9) මේ වගන්තියේ "උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙහි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථය ම ඇත්තේ ය.

15. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා කාර්යාංශයේ සියලු නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය. කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

16. අල්ලස් පනතේ අර්ථානුකූලව, කාර්යාංශය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව කාර්යාංශය උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

17. (1) කාර්යාංශයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, කාර්යාංශය විසින් ඒ අරමුදල පවත්වා ගෙන යනු ලැබිය යුතු ය. කාර්යාංශයේ අරමුදල.

(2) කාර්යාංශයේ අරමුදලට—

(අ) කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ; සහ

(ආ) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී, කාර්යාංශයට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) කාර්යාංශය විසින්, එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

18. (1) කාර්යාංශයේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය. කාර්යාංශයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

(2) කාර්යාංශය විසින්, එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට, කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

19. (1) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත ලියවිලි ලකින් පොදු විධාන දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ සෑම විධානයක් ම, බලාත්මක කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත දෙනු ලබන විධාන.

(2) මණ්ඩලය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක, තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයක්ම, මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත් කර ගැනීම.

20. (1) කාර්යාංශයේ යම් කාර්යයක් සඳහා කිසියම් නිශ්චල දේපළක් අත් කර ගැනීම අවශ්‍ය වන්නාවූ ද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යෝජිත අත් කර ගැනීම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නාවූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ දේපළ ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ අත් කර ගෙන කාර්යාංශය වෙත පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ කාර්යාංශය සඳහා යම් නිශ්චල දේපළක් අත් කර ගැනීමේ දී දරන ලද යම් වියදමක්, කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ කාර්යාංශයේ විධානය මත කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

21. (1) කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක්—

(අ) කාර්යාංශය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කාර්යාංශයට විරුද්ධව; හෝ

(ආ) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ කාර්යාංශයේ යම් නිලධරයකු නැතහොත් සේවකයකු විසින් හෝ, මේ පනත යටතේ හෝ කාර්යාංශයේ විධානය මත හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට හෝ නිලධරයාට නැතහොත් සේවකයාට විරුද්ධව

පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි කාර්යාංශය විසින් හෝ කාර්යාංශයට විරුද්ධව හෝ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශය විසින් දරන ලද වියදම් කිසිවක්, කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, කාර්යාංශය වෙත ගෙවන ලද හෝ කාර්යාංශය විසින් අයකර ගන්නා ලද නඩු ගාස්තු කිසිවක්, කාර්යාංශයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ කාර්යාංශයේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි පවරන ලද යම් සිවිල් හෝ අපරාධ හෝ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම, ඒ සිවිල් හෝ අපරාධ හෝ නඩුවේ දී ඔහු විසින් අය කර ගනු ලැබේ නම් මිස, කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ දේපළ කාර්යාංශය සතු කිරීම.

22. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි "පැවරීමේ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක දී, පැවරීමේ දිනයට පෙරාතුව ම භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබූ

හෝ එයට යටත් ව තිබූ ( (2) වන උපවගන්තියෙහි සඳහන් ගිවිසුම මගින් බැහැර කරන ලද ඒවා නොවන) සියලු දේපළ, අයිතිවාසිකම් හා බැරකම් කාර්යාංශය සතු විය යුතු ය.

(2) පැවරීමේ දිනයට පෙරාතුව ඕනෑම අවස්ථාවක දී, ඒ දිනයට පසුව භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රැඳී තිබිය යුතු දේපළ, අයිතිවාසිකම් හා බැරකම් පිළිබඳව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ කාර්යාංශය විසින්, ලියවිල්ලකින් එකඟත්වයකට එළඹිය හැකි ය.

කොන්ත්‍රාත් ගිවිසුම් සහ අයිතිවාසිකම් ආදිය පැවරීම හා සතු කිරීම.

23. (1) 22 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් ගිවිසුම මගින් බැහැර කරනු ලැබ ඇත්නම් හැර, පැවරීමේ දිනයෙහි සිට—

(අ) භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෝ එය සමග හෝ එය වෙනුවෙන් හෝ ඇතුළත්ව ඇත්තාවූ ද පැවරීමේ දිනයට ඉහතින් ම වූ දිනයේ පැවතියාවූ ද, සියලු ගිවිසුම් සහ වෙනත් එකඟවීම්, ඒ දිනයෙහි සිට, කාර්යාංශය විසින් හෝ එය සමග හෝ එය වෙනුවෙන් හෝ ඇතුළත් වුණු ගිවිසුම් නැතහොත් වෙනත් එකඟවීම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) පැවරීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි පැවැති, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ සියලු සම්බන්ධතා, අයිතිවාසිකම්, පරවශතා, බැඳීම්, ණය හා වගකීම් ඒ දිනයෙහි සිට කාර්යාංශයේ සම්බන්ධතා, අයිතිවාසිකම්, පරවශතා, බැඳීම්, ණය හා වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැවරීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි ස්ථාපනය කරනු ලැබූ නඩත්තු කරනු ලැබුවා වූ සියලු සවිකිරීම්, පිරියත හා උපකරණ සහ වෙනත් දේපළ හා එම දෙපාර්තමේන්තුවේ කාර්ය සඳහා පාවිච්චි කරන ලද කවර වූ හෝ විස්තරයකට අයත් සියලු දේ, ඒ දිනයේ සිට, කාර්යාංශය වෙත පවරනු ලැබිය යුතු අතර ඒවා කාර්යාංශය සතුවිය යුතු ය.

(ඇ) භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා වෙනුවෙන් පැවරීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි ආණ්ඩුවට ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් කිසිවක් අයකර ගැනීමේ හෝ ලබා ගැනීමේ හෝ අයිතිය කාර්යාංශයට තිබිය යුතු ය.

(2) ආණ්ඩුවේ ඒකාබද්ධ සේවයට අයත් නොවන්නා වූ ද නියමිත දිනයට පෙරාතුව ම ඒ දිනයේ දී සේවයේ යෙදී සිටියා වූ ද සෑම රජයේ නිලධරයකුට ම, ඔහු දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්තව සිටිය දී අදාළ වූ නියම හා කොන්දේසිවලට වඩා අඩු වාසිදායක නොවන නියම හා කොන්දේසි මත, කාර්යාංශය විසින් සේවා නියුක්තිය අර්පණය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් ඉවත් වී ඇතැයි සලකනු ලැබිය යුතු ය;

(ආ) කාර්යාංශයේ කාර්ය ඔහු පත් කරනු ලැබූ අවස්ථාවේදී රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශිත තනතුරක් වූයේ නම්,—

(i) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු පත් කරනු ලැබූ දිනයෙහි තනතුර අහෝසි කිරීමේ හේතුව මත ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබ තිබිණි නම්, ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට පිරිනැමිය හැකිව තිබුණු ප්‍රදානයක් ලැබීමට, ඔහු සුදුසුකම් ලැබිය යුතු ය;

(ii) ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ පිරිනමනු ලැබූ එවැනි යම් ප්‍රදානයක මුදල, කාර්යාංශයේ ඔහුගේ සේවා නියුක්තිය, වයස හෝ අයහපත් සෞඛ්‍යය හෝ මත විශ්‍රාම යාම හෝ කාර්යාංශයේ ඔහු විසින් දරන ලද තනතුර අහෝසි කිරීම හේතු කොට ගෙන හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ අවසන් කරනු ලැබුවහොත් මිස, ඔහු වෙත ගෙවනු නොලැබිය යුතු ය;

(iii) ඔහු කාර්යාංශයේ සේවයෙහි නියුක්තව සිටියදී මිය ගියහොත්, කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු පත් කරනු ලැබීමට පෙරාතුවම ඔහු මිය ගියේ නම්, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙනුවෙන් පිරිනැමිය හැකිව තිබුණු යම් ප්‍රදානයක් ඔහු වෙනුවෙන් පිරිනමනු ලැබිය හැකි ය; තව ද

(ඇ) කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ඔහු පත් කරනු ලැබූ අවස්ථාවේදී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකුව සිටියේ නම් ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ඔහුගේ ගිවිසුම අවසන් කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වී ඇති ලෙස, ඒ ආඥාපනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු කාර්යාංශය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කාර්යාංශය සඳහා සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුව වෙත කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු විසින් ඒ වගන්තිය යටතේ කරන ලද අර්පණය භාර ගනු නොලැබූ අවස්ථාවක,—

(අ) ඔහු නියමිත දිනයේදී රාජ්‍ය සේවයෙන් ඉවත් වී ඇතැයි සලකනු ලැබිය යුතු ය ;

(ආ) (i) නියමිත දිනයට පෙරාතුවම ඒ දිනයේදී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔහු දැරූ තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශිත තනතුරක් වූයේ නම්, නියමිත දිනයේ දී ඔහු තනතුර අහෝසි කිරීමේ හේතුව මත ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වන ලද නම් ඔහුට ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ පිරිනැමිය හැකිව තිබුණු යම් ප්‍රදානයක් ඔහුට පිරිනමනු ලැබිය යුතු ය ;

(ii) නියමිත දිනයට පෙරාතුවම දිනයේදී ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකුව සිටියේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ඔහුගේ ගිවිසුම අවසන් කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වී ඇති ලෙස, ඒ ආඥාපනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ ආඥාපනත යටතේ ප්‍රදානයක් සඳහා ඔහු සුදුසුකම් ලැබිය යුතු ය.

24. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, 22 වන වගන්තිය ප්‍රකාර, යම් නිශ්චල දේපළක් හෝ ඒ පිළිබඳ යම් සම්බන්ධතාවක් හෝ සතුවීම, ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ යම් අවශ්‍යතාවක් පිළිබඳ ඔප්පු කිරීමක් නොමැතිව ඒ සියලු නිශ්චල දේපළවල හෝ ඒ පිළිබඳ යම් සම්බන්ධතාවක හෝ පරම අයිතිය, කාර්යාංශය වෙත දෙනු ලැබූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

පැවරීම මගින් නිශ්චල දේපළෙහි පරම අයිතිය කාර්යාංශය වෙත දෙනු ලැබිය යුතු බව.

25. 22 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් ගිවිසුම මගින් බැහැර කරන ලද ඒවා නොවන, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ දේපළ, අයිතිවාසිකම් හා බැරකම් කාර්යාංශය වෙත පැවරීම, පැවරීමේ දිනයට ඉහාතින් ම වූ දිනයෙහි, තුන්වන පාර්ශ්වකරුවකු හා භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව අතර පවත්නා යම් ගිවිසුමක හෝ එකඟවීමක ඒ තුන්වන පාර්ශ්වකරුගේ අයිතිවාසිකම් කෙරෙහි හානිකර ලෙස බලපාන්නේ යයි කිසිදු ආකාරයකින් සලකනු නොලැබිය යුතු ය. තවද එවැනි සෑම ගිවිසුමක් ම හෝ එකඟවීමක් ම, ඒ ගිවිසුමෙහි හෝ එකඟවීමෙහි භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳව වූ සෑම සඳහන් කිරීමක් ම, කාර්යාංශය පිළිබඳව වූ සඳහන් කිරීමක් වූවාක් මෙන් පැවරීමේ දිනයෙන් පසු වලංගු විය යුතු අතර, කාර්යාංශයට පක්ෂව හෝ එරෙහිව ඒවා ක්‍රියාත්මක කිරීමට හැකි විය යුතු ය.

තුන්වන පාර්ශ්වකරුවකුගේ අයිතිවාසිකම්වලට හානිකර ලෙස බල නොපෑ යුතු බව.

## II වන කොටස

### ඛනිජවල හිමිකම් හා බලපත්‍ර නිකුත් කිරීම

ඛනිජවල හිමිකම සහ ඒවා සොයා ගැනීම.

26. (1) ඛනිජ හමුවූයේ නැතහොත් පිහිටියේ යම් පසක් මත ද, පසක් තුළ ද නැතහොත් පසක් යට ද, ඒ පස කෙරෙහි යම් තැනැත්තකුට ඇති හිමිකමේ හෝ අන්‍යාකාරයක වූ අයිතිවාසිකම් කුමක් වුවද ඒ ඛනිජවල හිමිකම, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි හා මේ පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රයකින් ප්‍රදානය කරනු ලැබූ අයිතිවාසිකම්වලට යටත්ව, මෙයින් ජනරජය වෙත සතු කරනු ලැබේ.

(2) ඛනිජ සොයා ගනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තා විසින් වහාම ඒ බව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

මේ පනත හයිඩ්‍රොකාබන් සම්බන්ධයෙන් බල නොපැවැත් විය යුතු බව.

27. 1961 අංක 28 දරන ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතෙහි සහ 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතෙහි විධිවිධාන අදාළ වන ඛනිජ ද්‍රව්‍ය කිසිවක් කෙරෙහි මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

පතල් කැනීම යනාදිය බලපත්‍රයක අධිකාරය යටතේ කළ යුතු බව.

28. (1) කිසිම තැනැත්තකු විසින් ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම තත් කාර්යය සඳහා මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ සහ එයට අනුකූලව අන්‍යාකාරයකින් හැර, කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන යටතේ තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය අනුව ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා පතල් කැනීම ගවේෂණය කිරීම, ඒවා සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම, නියමිත දිනයට පෙර ආරම්භ කර ඇති යම් තැනැත්තකු, ඒ දිනයේ සිට මාස හයක කාලයක් ඉදිරියට එසේ කර ගෙන යා යුතු නමුත්, ඒ කාලය තුළදී මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රයක් සඳහා ඔහු ඉල්ලුම් කළ යුතු ය. තවද ඒ දින යෙන් පසුව කණින ලද ඛනිජ කිසිවක්, පතලෙන් ඉවත් කර ගෙන යාම හෝ බැහැර කිරීම, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක නියමවලට හා කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, එසේ ඉවත් කර ගෙන යාම හෝ බැහැර කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) ඛනිජ ද්‍රව්‍ය මහජනයාට විකිණීම පිණිස නැතහොත් අඩක් නිම වූ හෝ නිම වූ හෝ නිෂ්පාදනවලට අන්තර්ගත කිරීම පිණිස සකස් කිරීමෙන් පසුව, ඒ ඛනිජ ද්‍රව්‍ය මිලට ගන්නා තැනැත්තකු, ඒ ඛනිජ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිණිස, බලපත්‍රයක් ඇටීම අවශ්‍ය නොවිය යුතු ය.

(3) ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා කැනීම පිණිස මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයක්, ඒ බලපත්‍රයේ අධිකාරය යටතේ කණින ලද ඛනිජ ද්‍රව්‍ය කිසිවක හිමිකම බලපත්‍රලාභියා වෙත පැවරිය හැකි ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවකින්, යම් ඉඩමක පොළොව තලයේ යම් අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට නැතහොත් යම් ඉඩමක ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැනීම පිණිස බලපත්‍රයක් දරන්නකුට, ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා, ඒ ඉඩමෙහි පතල් කැනීම හෝ ඒ ඉඩමෙන් ප්‍රවාහනය කිරීම පිණිස බලපත්‍රයක් ලබා ගැනීම, අවශ්‍ය වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

බලපත්‍ර නිකුත් කිරීමෙහි ලා සීමා කිරීම.

29. ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළෙඳාම් කිරීම, අපනයනය කිරීම පිණිස වූ බලපත්‍රයක්—

(අ) (i) වයස අවුරුදු දහ අටට අඩු;

(ii) රජයේ නිලධරයකු හෝ යම් පළාත් සභාවක නැත හොත් පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයකු;

(iii) ශ්‍රී ලංකාවේ බලාත්මක වන යම් නීතියක් යටතේ සිහි විකල් බවට ප්‍රකාශිත තැනැත්තකු;

(iv) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක හෝ බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට හෝ බුන්වත් බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් කරනු නොලැබූ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු

වන පුද්ගලයකු වෙත ;

(ආ) (i) ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාරික කටයුතු කිරීමට ලියාපදිංචි කර නොමැති ;

(ii) බුන්වත් ලෙස ප්‍රකාශ කරනු ලැබූ නැතහොත් ඈවර කරනු ලැබීමට යටත්

සමාගමක් වෙත ;

(ඇ) (i) ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම පිණිස ලියාපදිංචි කර නොමැති ;

(ii) බුන්වත් ලෙස ප්‍රකාශ කරනු ලැබූ නැතහොත් ඈවර කරනු ලැබීමට යටත්

ව්‍යාපාර ආයතනයක් වෙත ;

(ඈ) බලපත්‍රය ඉල්ලුම් කර ඇත්තේ යම් කටයුතු වෙනුවෙන් ද, කාර්යාංශයේ මතය අනුව, ඒ කටයුතු කරගෙන යාමට අවශ්‍ය මූල්‍ය ශක්‍යතාව හා කාර්මික සුදුසුකම් නොමැති යම් ඉල්ලුම්කරුවකු වෙත :

(ඉ) බලපත්‍රය නිකුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවීම පැහැර හරින යම් ඉල්ලුම්කරුවකු වෙත

නිකුත් කරනු නොලැබිය යුතු ය.

බලපත්‍ර නිකුත් කිරීමේ බලතල සම්බන්ධයෙන් සීමා කිරීම.

30. (1) කාර්යාංශය විසින්,—

(අ) අමාත්‍යවරයාගේ සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, (231 වන අධිකාරය වූ) සුසාන භූමි සහ සොහොන් පිටි ආඥා පනතේ අර්ථානුකූලව යම් සුසාන භූමියක් හෝ සොහොන් පිටියක් මත ;

(ආ) අමාත්‍යවරයාගේ සහ අදාළ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, දුම්රිය මාර්ගයක, ගුවන් තොටුපලක, පාරක, මහා මාර්ගයක, විදුලි රැහැන් මාර්ගයක, හෝ වෙනත් ප්‍රසිද්ධ කර්මාන්තයක හෝ පොදු ගොඩනැගිල්ලක සිට, නියම කරනු ලැබිය හැකි යම් දුරක් ඇතුළත පිහිටි යම් ඉඩමක් මත ;

(ඇ) අමාත්‍යවරයාගේ සහ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ අර්ථානුකූලව, ජලාශයක, ඇලක, වැවක හෝ කණ්ඩියක සිට නියම කරනු ලැබිය හැකි යම් දුරක් ඇතුළත පිහිටි යම් ඉඩමක් මත ;

(ඈ) අමාත්‍යවරයාගේ සහ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ අර්ථානුකූලව, යම් වන සත්ව ආරක්ෂිත ප්‍රදේශයක්, ස්වභාවික ආරක්ෂිත ප්‍රදේශයක්, වනාන්තරයක් හෝ උද්‍යානයක් මත ;

(ඉ) අමාත්‍යවරයාගේ සහ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ අර්ථානුකූලව ජලධාරා ප්‍රදේශයක සිට, නියම කරනු ලැබිය හැකි යම් දුරක් ඇතුළත පිහිටි යම් ඉඩමක් මත ;

(ඊ) අමාත්‍යවරයාගේ සහ වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ අර්ථානුකූලව, අක් වෙරළ හෝ මුහුදු පතුල මත ;

(උ) අමාත්‍යවරයාගේ සහ රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, යම් නාවුක, යුද්ධ හෝ ගුවන් හමුදා අධිකාරයක් සතුව ඇති යම් ඉඩමක් මත ;

(ඉ) අමාත්‍යවරයාගේ සහ පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව, යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් සතුව ඇති ඉඩමක් මත

යම් ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැනීම සඳහා යම් තැනැත්තකු වෙත බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා අනුමතය දීමේ දී, අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියෙහි සඳහන් අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයන් හෝ විසින්, මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කොන්දේසියකට යටත්ව, ඒ අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයන් විසින් තීරණය කරනු ලබන වැඩිදුර කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය. වැඩිදුර කොන් දේසි කිසිවකට යටත්ව අනුමතය දෙනු ලබන අවස්ථාවක කාර් යාංශය විසින් ඒ කොන්දේසි, බලපත්‍රයෙහි සඳහන් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

31. කාර්යාංශය විසින් කිසිම තැනැත්තකු වෙත— බලපත්‍ර කිසිවක් නිකුත් කරනු නොලැබිය යුතු ප්‍රදේශ.

(අ) රජයේ ඉඩමක පිහිටි ස්මාරකයකට හෝ යම් ආරක් ෂිත ස්මාරකයකට හෝ (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ නියමිත පරිදි වූ යම් දුර ප්‍රමාණයක් ඇතුළත පිහිටි යම් ඉඩමක් මත ; සහ

(ආ) පුරාවිද්‍යා ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස, පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් එකී ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද ඉඩ මක් මත

ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැනීම පිණිස බල පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

32. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින්, ඒ නිවේදනයෙහි විස්තර කර ඇති ප්‍රදේශය, ඒ නිවේදනයෙහි සඳහන් ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම හෝ කැනීම හෝ සම් බන්ධයෙන් ආරක්ෂා කර තිබිය යුතු බවට අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය : සංචිත සහ ආරක්ෂක ප්‍රදේශ.

එසේ වුව ද යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් තත් කාලයෙහි වලංගුව පවතී නම්, ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ කිසිදු නිවේදන යක් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිවේදනයක විස්තර කර ඇති යම් ප්‍රදේශයක් ඇතුළත යම් ඉඩමක ඒ නිවේ දනයෙහි සඳහන් ඛනිජ ද්‍රව්‍යයක් නොවන ඛනිජ ද්‍රව්‍යයන් සඳහා ගවේෂණය කිරීම පිණිස හෝ කැනීම පිණිස කාර්යාංශය විසින් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

ආරක්ෂිත ඛනිජ ද්‍රව්‍ය.

**33.** (1) අමාත්‍යවරයාගේ හා වෙනත් යම් අදාළ අමාත්‍යවරයකුගේ අනුමතය ඇතිව මිස, යුරේනියම්, තෝරියම්, බෙරිලියම්, ලිතියම්, මිනිරන් හා වෙනත් යම් නියමිත ඛනිජ ද්‍රව්‍යයක් ගවේෂණය කිරීම හෝ කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම සඳහා කිසිම බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියමයෙහි සඳහන් කරනු ලබන වෙනත් යම් වර්ගවල ඛනිජ ද්‍රව්‍යයක් ආරක්ෂිත ඛනිජ ද්‍රව්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම ද, ඒ ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණ කිරීම හෝ පතල් කැනීම, ඒවා එක් රැස් කිරීම, ඉවත් කරගෙන යාම, ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම පිණිස බලපත්‍රයක් නිකුත් කළ යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි නියම කිරීම ද, අමාත්‍යවරයා විසින්, කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි යම් ඛනිජ ද්‍රව්‍යයක් සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැනීම, ඒවා එකරැස් කිරීම, ඉවත් කරගෙන යාම, ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම පිණිස බලය දෙමින් ඒ නියමයෙහි දිනයට පෙරාතුව නිකුත් කරන ලද යම් බලපත්‍රයකට, එසේ නියම කරන ලද කොන්දේසි අදාළ නොවිය යුතු ය.

බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

**34.** මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, නියමිත ආකෘතියෙහි නියමිත විස්තර ඇතුළත් කර නියමිත ලේඛන ද සමග කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සමග නියමිත ගාස්තුව ද එවනු ලැබිය යුතු ය.

බලපත්‍රය නිකුත් කිරීම.

**35.** (1) මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, කාර්යාංශය විසින් 33 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය; නැතහොත් කාර්යාංශය විසින් වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත, ඒ ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම,—

(අ) (4) වන උපවගන්තියෙහි සඳහන් ආකෘතියෙහි විය යුතු අතර, එහි සඳහන් යම් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය;

(ආ) ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැනීම, ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම පිණිස බලපත්‍රයෙන් අවසර දී ඇත්තේ යම් ප්‍රදේශයක් වෙනුවෙන් ද, ඒ ප්‍රදේශය නිශ්චය කොට දක්වා තිබිය යුතු ය;

(ඈ) ගවේෂණය කිරීමට පතල් කැනීමට, ප්‍රවාහනය කිරීමට, සකස් කිරීමට, වෙළඳාම් කිරීමට හෝ අපනයනය කිරීමට අවසර දී ඇත්තේ යම් ඛනිජ ද්‍රව්‍ය වෙනුවෙන් ද ඒ ඛනිජ ද්‍රව්‍ය නිශ්චය කොට දක්වා තිබිය යුතු ය ;

(ඇ) පැවරීමට හෝ ඇපයක් වශයෙන් දීමට හෝ නොහැකි විය යුතු ය; තවද,

(ඉ) ඒ බලපත්‍රයේ කාලය නිශ්චය කොට දක්වා තිබිය යුතුය :

එසේ වුව ද කාර්මික පතල් කැනීමේ බලපත්‍රයක්, ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ආයෝජන ගිවිසුමක් ප්‍රකාරව ද, ඒ ආයෝජන ගිවිසුමේ විධිවිධාන සලසා ඇති ආකාරයට හෝ කාර්යාංශයේ අනුමතය ඇතිව අන්‍යාකාරයකින් හා නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, පවරනු ලැබිය හැකිය ; නැතහොත් ඇප යක් වශයෙන් දෙනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එහි සඳහන් කර ඇති කාලය සඳහා වලංගු විය යුතු ය.

(4) මේ පනත යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක ම වෙනත් කොන්දේසි අතර, 30 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කොන්දේසිවලට අමතරව :—

(අ) බලපත්‍රයෙන් අවසර දී ඇති ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැනීම, ඒවා සකස් කිරීම, වෙළඳාම් කිරීම හෝ අපනයනය කිරීම, වංචාකාරී ලෙස, අනවධානාත්ම කව, ඇඩි නොසැලකිල්ලෙන් යුතුව හෝ ඕනෑකමින් ම අනිසි ආකාරයකට නොකළ යුතු බවට ;

(ආ) බලපත්‍රය යටතේ තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී සොයා ගනු ලබන ඛනිජ ද්‍රව්‍ය සොයා ගැනීම පිළිබඳව බල පත්‍රලාභියා කාර්යාංශය වෙත දැනුම් දිය යුතු බවට ;

(ඇ) බලපත්‍රය යටතේ තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී, බලපත්‍රලාභියා විසින්, පරිසරය, සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රමිති රැක ගැනීමට සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමට අදාළ වූ සියලු ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවට ;

(ඈ) බලපත්‍රයෙන් අවසර දෙන ලද ගවේෂණය හෝ පතල් කැනීම අවසන් වූ පසු, බලපත්‍රලාභියා විසින්, ඒ බලපත්‍රය අදාළ වන ඉඩම, නියම කරනු ලැබිය හැකි යම් තත්ත්වය කට පුනරුත්ථාපනය කළ යුතු බවට ;

(ඉ) කාර්යාංශයේ පූර්ව අනුමතය ඇතිව හැර, බලපත්‍රලාභියා, විසින් මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බලපත්‍ර යෙන් අවසර දී ඇති මෙහෙයවුම් අත්හිටුවීම, සීමා කිරීම හෝ නතර කිරීම නොකළ යුතු බවට ;

(ඊ) මේ පනතේ විධිවිධාන සහ, ඒ යටතේ සාදන ලද යම් නියෝග අනුව බලපත්‍රලාභියා ක්‍රියා කළ යුතු බවට;

(උ) පවත්වාගෙන යා යුතු යයි කාර්යාංශය විසින් බලපත්‍රලාභියාට නියම කරනු ලබන, පොත්, වාර්තා, වෙනත් ලේඛන හා ද්‍රව්‍ය බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යා යුතු බවට; සහ ඒවායේ අවශ්‍ය විස්තර ඇතුළත් කළ යුතු බවට;

(ඌ) ඒ බලපත්‍රය ප්‍රකාර හෝ එය යටතේ හෝ බලපත්‍රලාභියා විසින් ගෙවනු ලැබීමට නියමිත ඒ බලපත්‍රය වෙනුවෙන් වූ ගාස්තු සහ වෙනත් යම් ගෙවීම්, මේ පනතින් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයකින් නියමිත යම් කාල යක් ඇතුළත දී බලපත්‍රලාභියා විසින් කාර්යාංශය වෙත ගෙවනු ලබන බවට ;

(එ) කාර්යාංශයේ යම් බලයලත් නිලධරයකුට, බලපත්‍රයෙන් අවසර දී ඇති කටයුතු කිසිවක් කරගෙන යන යම් ස්ථාන යකට ප්‍රවේශවීමට ද, බලපත්‍රයෙන් නියමිත පරිදි බලපත්‍ර ලාභියා විසින් පවත්වා ගෙන යනු ලබන සියලු පොත්, වාර්තා හා වෙනත් ලේඛන ඒ නිලධරයාට ලබා දීමට ද බලපත්‍රලාභියා විසින් ඉඩ සැලැස්විය යුතු බවට සහ ඒ නිල ධරයා විසින් දෙනු ලබන නීත්‍යානුකූල විධාන හෝ නියම කිසිවක් අනුව බලපත්‍රලාභියා ක්‍රියා කළ යුතු බවට ;

(ඒ) මේ පනතේ යම් විධිවිධානයක් මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් බලපත්‍රලාභියා විසින් කාර්යාං ශය වෙත ඉදිරිපත් කරනු ලැබීමට නියමිත වාර්තා හෝ දෙනු ලැබීමට නියමිත දැන්වීම්, ඒවා ඉදිරිපත් කිරීමට හෝ දීමට හෝ නියමිත යම් කාලයක් ඇතුළත ඔහු විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට හෝ දිය යුතු බවට

කොන්දේසි ඇතුළත් විය යුතු ය.

බලපත්‍රයක් අලුත් කිරීම.

**36.** මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අවසන් වීමට දින තිහකට නොඅඩු කාලයකට පෙර, කාර්යාංශය වෙත ඉදිරි පත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත—

(අ) ඒ බලපත්‍රයට අදාළ නියම හා කොන්දේසි බලපත්‍රලාභියා විසින් පිළිපැද ඇති බවට කාර්යාංශය සෑහීමට පත් වේ නම්; සහ

(ආ) බලපත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තු බලපත්‍රලාභියා විසින් ගෙවනු ලබන්නේ නම්,

බලපත්‍රයෙහි සඳහන් කර ඇති කාලය ඉකුත් වීමෙන් පසුව ඒ බල පත්‍රය අලුත් කරනු ලැබිය යුතු ය.

37. (1) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රලාභියා විසින්— බලපත්‍රයක් අවලංගු කිරීම.

(අ) ඒ බලපත්‍රයට අදාළ යම් නියමයක් හෝ කොන්දේසියක් හෝ උල්ලංඝනය කර ඇති බවට;

(ආ) කාර්යාංශය විසින් ඔහු වෙත දෙන ලද යම් නීත්‍යානුකූල විධානයක් ක්‍රියාත්මක කර නොමැති බවට;

(ඇ) හානියට හේතුවන පතල් කැනීම්වලට එරෙහිව කාර්යාංශය විසින් ලිඛිතව කලින් අවවාද කර තිබියදීත් හානියට හේතුවන පතල් කැනීම් කර ගෙන යන බවට;

(ඈ) ඒ බලපත්‍රය මගින් අවසර දී ඇති යම් කටයුත්තක් කර ගෙන යාම, කාර්යාංශයේ අවසරය නොමැතිව මාස හයකට වැඩි කාලයක් අත්හිටුවා ඇති බවට, සීමා කර ඇති බවට හෝ නතර කර ඇති බවට;

(ඉ) මේ පනතේ නියමයන් සපුරාලීමට යටත්ව, තම බලපත්‍රය භාර දී ඇති බවට; සහ

(ඊ) මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යටතේ වරදකට වරදකරු වී ඇති බවට

කාර්යාංශය සෑහීමට පත් වන්නේ නම්, කාර්යාංශය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) කාර්යාංශයේ තීරණයට විරුද්ධව 39 වන වගන්තිය යටතේ අභියාචනය කිරීම සඳහා වූ කාලය ඉකුත් වන තෙක් හෝ නියමිත කාලය තුළ දී අභියාචනයක් ඉදිරිපත් කර ඇති විටක ඒ අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත්නම් මිස හා එසේ නිෂ්ප්‍රභ කරනු ලබන තෙක්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවිය යුතුය.

38. (1) බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් බලපත්‍රයක් අවලංගු කිරීමට කාර්යාංශය තීරණය කරන අවස්ථාවක, කාර්යාංශය විසින්, එහි තීරණය, ඒ සඳහා වූ හේතු ද සමග, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභී හෝ වෙත ලියාපදිංචි තැපැලෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය. කාර්යාංශයේ තීරණය ඒ සඳහා වූ හේතු ද සමග කාර්යාංශය විසින් ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභී වෙත දැනුම් දිය යුතු බව.

(2) යම් ඉල්ලුම්කරුවකු හෝ බලපත්‍රලාභියකු හෝ වෙත මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දැනුම් දිය යුතු යම් තීරණයක්, ඒ ඉල්ලුම්කරුගේ හෝ බලපත්‍රලාභියාගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය වෙත හෝ ඒ දැනුම් දීම ලියාපදිංචි තැපැලෙන් යවන ලද දිනයෙහි සිට ගණන් බලනු ලබන දින තුනක කාලයක් ඉකුත්වීමෙන් පසුව, දැනුම් දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

අභියාචන.

39. (1) (අ) 35 වන වගන්තිය හෝ 36 වන වගන්තිය හෝ යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ;

(ආ) 37 වන වගන්තිය යටතේ තමාගේ බලපත්‍රයක් අවලංගු කිරීමේ

කාර්යාංශයේ තීරණයෙන් අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුවකු හෝ බලපත්‍රලාභියකු හෝ විසින්, ඒ තීරණය තමා වෙත දන්වන ලද දිනයේ සිට දින දහහතරක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන්, කරුණු කියා සිටීමට අභියාචකට සහ කාර්යාංශයට අවස්ථාවක් ලබා දීමෙන් පසු, ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, අභියාචනයට විෂය වූ බලපත්‍රය නිකුත් කරන ලෙස හෝ අලුත් කරන ලෙස හෝ කාර්යාංශයට විධාන කරනු ලැබිය හැකි ය; නැතහොත්,

(ආ) අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය.

(3) ලේකම්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ කාර්යාංශය වෙත නිකුත් කරන ලද යම් විධානයක් අනුව කාර්යාංශය කටයුතු කළ යුතු ය.

(4) බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා හෝ ඉල්ලුම් පත්‍රයක්, මේ පනතේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය සමග එවන ලද ගාස්තුව, කාර්යාංශය විසින්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභි හෝ වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් තමාගේ තීරණය, ඒ සඳහා වූ හේතු ද සමග ලේකම්වරයා විසින් අභියාචක වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) අභියාචක වෙත දැනුම් දිය යුතු යම් තීරණයක් ඒ අභියාචකගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය හෝ වෙත ඒ දැනුම් දීම ලියාපදිංචි තැපෑලෙන් යවන ලද දිනයෙහි සිට ගණන් බලනු ලබන දින තුනක කාලයක් ඉකුත්වීමෙන් පසුව, දැනුම් දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම.

40. (1) 39 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ ලේකම්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම අභියාචනයක් ම ශ්‍රේෂ්ඨාධිකරණයේ අදාළ රීති මගින් නියමිත ආකාරයෙන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, ඒ අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණය ස්ථිර කිරීම නැතහොත් වෙනස් කිරීම, කළ හැකි ය.

බලපත්‍රය අවසන් වීම.

41. (1) වගකීම් සීමාසහිත සමාගමක් වන බලපත්‍රයක් දරන්නකු වස්තු භංගත්වයට පත් වුවහොත් හෝ බුන්වත් යයි විනිශ්චය කරනු ලැබුවහොත් ඒ සමාගම වස්තු භංගත්වයට පත්වූ නැතහොත් බුන්වත් බවට පත්වූ බවට විනිශ්චය කරන ලද දිනයෙහි සිට ඒ බලපත්‍රය අවසන් වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රයක් දරන්නකු මියගියහොත් හෝ වස්තු භංගත්වයට පත් වුවහොත් හෝ බුන්වත් යයි විනිශ්චය කරනු ලැබුවහොත්, බලපත්‍රලාභියා මියගිය හෝ වස්තු භංගත්වයට නැතහොත් බුන්වත් බවට පත්වී ඇතැයි විනිශ්චය කරන ලද දිනයේ සිට ඒ බලපත්‍රය අවසන් වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) හවුල් ව්‍යාපාරයක් වන බලපත්‍රයක් දරන්නකු, ඒ හවුල් ව්‍යාපාරය විසුරුවා හරින ලද දිනයේ සිට ඒ බලපත්‍රය අවසන් වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

ඛනිජ ජලය සෙවීම හෝ වැඩි දියුණු කිරීම හෝ යනාදිය සඳහා බලපත්‍රයක් අවශ්‍ය නොවන බව.

42. වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, යම් ඉඩමක හිමිකරු හෝ පදිංචිකරු හෝ එවැනි ඉඩමක ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීමට හෝ පතල් කැනීමට අවසර දෙන ලද බලපත්‍රලාභියකු හෝ විසින් තමාගේ පෞද්ගලික ප්‍රයෝජනය පිණිස, ඒ ඉඩමෙහි හෝ ඒ ඉඩමෙන්, ඛනිජ ජලය සෙවීම, වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරිභෝජනය කිරීම ඒ සඳහා බලපත්‍රයක් නොමැතිව කරනු ලැබිය හැකි ය.

කාර්යාංශය මේ පනතේ පරිපාලනය භාරව සිටිය යුතු බව.

43. කාර්යාංශය, මේ පනතේ සහ ඒ යටතේ සාදනු ලබන නියෝගවල පරිපාලනය භාරව සිටිය යුතු ය.

කාර්යාංශයේ බලතල.

44. මේ පනතේ විධිවිධානවලට යටත්ව, කාර්යාංශයට—

(අ) මේ පනත යටතේ නිකුත් කරන ලද සියලු බලපත්‍ර සම්බන්ධයෙන් වූ ද, මේ පනත යටතේ ප්‍රකාශ කරන ලද සංවෘත හා ආරක්ෂක ප්‍රදේශ සහ ආරක්ෂිත ඛනිජ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ ද සියලු ලේඛන, සිතියම් හා වෙනත් වාර්තා සහ ද්‍රව්‍ය, පවත්වා ගෙන යාමේ සහ, රහස්‍යතාව පිළිබඳ වූ වගකීමකට යටත්ව මහජනයා විසින් පරීක්ෂා කර බැලීම පිණිස ඒ ලේඛන, සිතියම් හා වෙනත් වාර්තා සහ ද්‍රව්‍ය විවෘතව තැබීමේ;

(ආ) මේ පනතේ යම් විධිවිධාන යටතේ කාර්යාංශය වෙත ලැබිය යුතු සියලු ගාස්තු, කුලී, රාජ්‍යභාග හා වෙනත් ගෙවීම් ඉල්ලා සිටීමේ, ලබා ගැනීමේ සහ අයකර ගැනීමේ;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් අවසර දී ඇති ගවේෂණ, පතල් කැනීම සහ වෙනත් කටයුතු අධීක්ෂණය කිරීමේ සහ ඒ කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳව බලපත්‍රලාභී යාට විධාන කිරීමේ ;

(ඇ) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක්, පතලක් හෝ වෙනත් ස්ථානයක් වෙනුවෙන් ද ඒ ඉඩමට, පතලට හෝ වෙනත් ස්ථානයට ඇතුළු වී ඒ බලපත්‍රයේ නියම හා කොන්දේසි හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ අනුව ක්‍රියා කර තිබේ ද යන වග නිසැකව දැන ගැනීම පිණිස අවශ්‍ය විය හැකි විමර්ශන හෝ සමීක්ෂණ, ඒ ඉඩමෙහි, පතලෙයි හෝ වෙනත් ස්ථාන යෙහි කරගෙන යාමේ ;

(ඉ) ස්වකීය බලපත්‍රයෙහි සඳහන් නියම හෝ කොන්දේසි කිසිවක් හෝ මේ පනතේ යම් විධිවිධාන යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යක් හෝ අනුව බලපත්‍රලාභියා ක්‍රියා නොකිරීමේ හේතුවෙන් උද්ගත වන යම් තත්ත්වයක් නතර කිරීමේ හෝ ඉවත් කිරීමේ ;

(ඊ) බලපත්‍රලාභියා වෙත නිකුත් කර ඇති බලපත්‍රය මගින් අවසර දී ඇති යම් කටයුත්තකට අදාළ මේ පනත යටතේ බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යනු ලැබීමට නියමිත පොත්පත්, වාර්තා හා වෙනත් ලේඛන පරීක්ෂා කිරීමේ සහ ඒවායේ පිටපත් ගැනීමේ ;

(උ) භූ විද්‍යාත්මක, ඛනිජ ද්‍රව්‍ය සහ පතල් කැනීම පිළිබඳ විමර්ශන පැවැත්වීමේ ;

(ඌ) ශ්‍රී ලංකාවේ ඛනිජ ද්‍රව්‍ය සම්පත්වලට අදාළ දත්ත එක්රැස් කිරීමේ, සකස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ සහ පළ කිරීමේ ;

(එ) ඛනිජ ද්‍රව්‍ය සම්පත්වලට අදාළ තොරතුරු ඓතිහාසික සහ ලේඛනාරක්ෂක කාර්යය සහ පරිපාලනමය කාර්යය සඳහා සුරක්ෂිත කිරීම පිණිස පහසුකම් සැලසීමේ

බලය තිබිය යුතු ය.

කාර්යාංශයේ නිලධරයන් සහ බලයලත් තැනැත්තන් විසින් සාම්පල ලබා ගැනීම.

45. යම් ඉඩමක් වෙනුවෙන් මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර තිබුණ ද නොතිබුණ ද, කාර්යාංශයේ නිලධරයන් හෝ කාර්යාංශය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ විසින්, සියලු යුක්ති සහගත වේලාවල දී ඒ ඉඩමට ඇතුලුවී, පරීක්ෂා කිරීමේ හා මාත්තු බැලීමේ කාර්යය සඳහා ඒ ඉඩමෙහි ඇති පසෙහි පාෂාණවල, ඛනිජ ද්‍රව්‍යවල හා වැලිකැටවල සාම්පල හෝ ආදර්ශක ලබා ගනු ලැබිය හැකි ය.

**46.** භූ විද්‍යාත්මක හා ඛනිජ ද්‍රව්‍ය පිළිබඳ විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා, කාර්යාංශයේ නිලධරයකු හෝ කාර්යාංශය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ විසින්,— **කාර්යාංශයේ නිලධරයන් යනාදීන්ගේ බලතල.**

(අ) ඒ කාර්යය සඳහා අවශ්‍ය තැනැත්තන්, යන්ත්‍රෝපකරණ, උපකරණ හා ද්‍රව්‍ය සමග කවර වූ හෝ ඉඩමකට ඇතුලු වී එහි රැඳී සිටිය හැකි ය ;

(ආ) ඒ ඉඩමේ යම් කොටසක පෘෂ්ඨය බිඳ, ඒ ඉඩම තුළ, මත හෝ යට පසෙහි පාෂාණවල හෝ ඛනිජ ද්‍රව්‍යවල සාම්පල හෝ ආදර්ශක ලබාගෙන ඉවතට රැගෙන යා හැකි ය ;

(ඇ) ඒ ඉඩම කැන, සිදුරු කර හෝ විද ඒ මත යම් කුළුණක් හෝ වෙනත් වස්තුවක් සවි කළ හැකි ය ; නැතහොත්

(ඈ) එවැනි විමර්ශනයක් කිරීමේ කාර්යය සඳහා හරහා යාමට අවශ්‍ය ඉඩමකට ඇතුළු වී, එය හරහා යා හැකි ය :

එසේ වුව ද,—

(i) යම් ඉඩමක් සම්බන්ධයෙන් මේ වගන්තියෙන් පැවරී ඇති බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට යටත් පිරිසෙයින් දින දහ හතරකට පෙර, ඒ බල තල ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බවට ලිය විල්ලකින් වූ දැන්වීමක් ඒ ඉඩම රජයේ ඉඩමක් නම් මිස, ඒ ඉඩමේ හිමිකරු හෝ පදිංචිකරු හෝ වෙත දෙනු ලැබිය යුතු ය ;

(ii) මේ වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හැකිතාක් දුරට අඩුම හානිය සහ අපහසු තාව පමණක් සිදුකළ යුතු අතර, මේ බලතල ක්‍රියාත් මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමන්ට සිදු වූ අලාභ හානි සඳහා වන්දි ලබා ගැනීමේ අයිතිය ඒ හිමිකරුට හෝ පදිංචිකරුට හෝ තිබිය යුතු ය ;

(iii) එවැනි යම් ඉඩමක් අතහැර දැමීමට පෙර, ඒ මත උපයෝගී කර ගන්නා ලද සියලු තැනැත්තන්, යන්ත්‍රෝපකරණ, උපකරණ හා ද්‍රව්‍ය ඉවත් කර ගනු ලැබිය යුතු අතර, ඒ මත කරන ලද සියලු කැනීම් ද සිදුරු කිරීමෙන් හෝ විදීමෙන් කරන ලද සියලු කුහර ද පුරවා දමනු ලැබිය යුතු ය ;

(iv) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් වෙනුවෙන් ද එවැනි යම් ඉඩමක් මත, මේ වගන්තියෙන් පවරා ඇති බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමෙහි ලා කිසිම විමර්ශන යක් කර ගෙන යාම නොකළ යුතු ය.

**47.** ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නොකර, රජයේ ඉඩමක් මත, ඛනිජ ද්‍රව්‍ය සඳහා වූ කිසිම විමර්ශනයක්, කාර්යාංශය විසින් කරනු නොලැබිය යුතු ය. **රජයේ ඉඩම් විමර්ශනය කිරීම.**

ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම පිණිස වූ බලපත්‍රයක අවශ්‍යතාව.

48. (1) වර්ග කිලෝ මීටර් එක් සියයක් ඉක්මවන යම් බිම් ප්‍රමාණයක් වෙනුවෙන් ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම පිණිස කිසිම බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම පිණිස වූ බලපත්‍රයක් ඒ බලපත්‍රයේ නියමය මගින් අත් හරිනු ලැබූ ද්‍රව්‍ය නොවන, සියලු ඛනිජ ද්‍රව්‍ය, බලපත්‍රයෙහි නිශ්චිත බිම් ප්‍රමාණය ඇතුළත, ගවේෂණය කිරීම සඳහා වූ අනන්‍ය අයිතිවාසිකම, බලපත්‍රලාභියා වෙත පිරිනැමිය යුතු ය.

බලපත්‍රයෙහි නිශ්චිත බිම් ප්‍රමාණයෙහි සියලු ඛනිජ ද්‍රව්‍ය සඳහා කැනීම කිරීමට පතල් කැනීමේ බලපත්‍රයක් යටතේ බලපත්‍රලාභියාට අයිතිය ඇති බව.

49. ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා පතල් කැනීමට, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, ඒ බලපත්‍රයෙහි නිශ්චිත බිම් ප්‍රමාණය, තුළ සියලු ඛනිජ ද්‍රව්‍ය සඳහා පතල් කැනීම සහ ඒ ඛනිජ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම හා අපනයනය කිරීම සඳහා අනන්‍ය අයිතිය ලැබීමේ හිමිකම බලපත්‍රලාභියා වෙත ලබා දිය යුතු ය.

බලපත්‍රය දරන්නා විසින් පොත් පත් වාර්තා යනාදිය පවත්වා ගෙන යා යුතු බව.

50. මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා විසින්, කාර්යාංශය විසින් නියම කරනු ලබන, ස්වකීය බලපත්‍රයෙන් අවසර දී ඇති කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා හා වෙනත් ලේඛන පවත්වා ගෙන යා යුතු අතර, ඒ කටයුතුවලට අදාළව කලින් කල කාර්යාංශයට අවශ්‍ය වන වාර වාර්තා හා තොරතුරු කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයෙහි නිශ්චිත බිම් ප්‍රදේශයේ සන්තකය සඳහා බලපත්‍රය දරන්නාට ඇති අයිතිය.

51. මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකුට, ඒ බලපත්‍රයෙහි නිශ්චිත ඉඩමේ යම් ප්‍රදේශයකට ඇතුලු වී එහි සන්තකය ඇරීමේ අයිතිය තිබිය යුතු ය :

එසේ වුව ද ඉඩමේ එවැනි යම් ප්‍රදේශයක සන්තකය ඒ ඉඩමේ අයිතිකරු විසින් දරනු ලබන අවස්ථාවක, මේ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති අයිතිවාසිකම් ඒ අයිතිකරුගේ කැමැත්ත ඇතිව මිස, බලපත්‍රය දරන්නා විසින් ක්‍රියාවේ නොයෙදිය යුතු ය.

බලපත්‍රය දරන්නා විසින් ඉඩමේ හිමිකරුට හෝ පදිංචිකරුට බාධා නොකළ යුතු බව.

52. (1) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු, ස්වකීය බලපත්‍රයෙහි සඳහන් ඉඩමෙහි හිමිකරුට හෝ පදිංචිකරුට නැතහොත් ඒ ඉඩම වෙනුවෙන් වෙනත් බලපත්‍රයක් දරන්නකුට බාධා කිරීමෙන් හා ඔවුන්ගේ පෞද්ගලික දේපළවලට හානි සිදු කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

(2) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්, ඔහුගේ බලපත්‍රයෙන් බලය දෙන ලද කටයුතු අවසන් වූ පසු හෝ ඔහුගේ බලපත්‍රයේ කාලය ඉකුත් වන දිනය යන මෙයින් කලින් එළඹෙන දිනයේ දී, ඉඩම කාර්යාංශය සෑහීමට පත්වන පරිදි ප්‍රතිෂ්ඨාපනය කළ යුතු ය.

(3) ඉඩම සතුටුදායක තත්ත්වයකට ප්‍රතිෂ්ඨාපනය කර නොමැති බව කාර්යාංශය විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, නියමිත ආකාරයට කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක වන්දියක්, ඒ ඉඩමේ අයිතිකරුට ගෙවීමට බලපත්‍රය දරන්නා බැඳී සිටින්නේ ය.

බලපත්‍රය දරන්නා විසින් පිරියත, යන්ත්‍රෝපකරණ යනාදිය ඉදි කිරීම හෝ සවි කිරීම කළ හැකි බව.

53. වෙනත් යම් නීතියක විධිවිධානවලට සහ නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්, ස්වකීය බලපත්‍රයෙහි නිශ්චිත බිම් ප්‍රමාණයෙහි පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ ඉදි කිරීම හෝ සවි කිරීම ද, ගොඩනැගිලි තැනීම ද කරනු ලැබිය හැකි ය.

හදිසි අවස්ථාවක දී, පිරියත, ගොඩනැගිලි යනාදිය ප්‍රයෝජනයට ගැනීමට රජයට හා කාර්යාංශයට අයිතිය ඇති බව.

54. මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්, යම් ඉඩමක් මත ඉදි කරන ලද, තනන ලද හෝ සවි කරන ලද පිරියත, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ පහසුකම් කිසිවක් නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක හා නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට තක්සේරු කරන ලද වන්දියක් ගෙවීමට යටත්ව හදිසි අවස්ථාවක දී හෝ යම් හදිසි අවස්ථාගත තත්ත්වයක දී පාවිච්චි කිරීමේ අයිතිය, රජයට හා කාර්යාංශයට තිබිය යුතු ය.

## III වන කොටස

### පතල්වල කම්කරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා සුභ සාධනය

ස්ත්‍රීන් සේවයෙහි නියුක්ත කිරීම සීමා කිරීම.

55. වයස කුමක් වුව ද කිසිම ස්ත්‍රියක්, යම් පතලක පොළොව යට කවර හෝ වේලාවක හෝ වැඩ නොකළ යුතු ය; නැතහොත් එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ අවසර දීම නොකළ යුතු ය.

යෞවනයකු සේවයෙහි නියුක්ත කිරීම සීමා කිරීම.

56. (1) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර, කිසිම යෞවනයකු යම් පතලක පොළොව යට වැඩ නොකළ යුතු ය; නැතහොත් එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ අවසර දීම නොකළ යුතු ය.

(2) වයස අවුරුදු දහසය සම්පූර්ණ කර නොමැති කිසිම යෞවනයකු යම් පතලක පොළොව යට වැඩ නොකළ යුතු ය; නැතහොත් එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ අවසර දීම නොකළ යුතු ය.

(3) වයස අවුරුදු දහසය සම්පූර්ණ කර ඇත්තා වූ ද, පතලක වැඩ කිරීමට අදහස් කරන්නා වූ ද යෞවනයකුගේ හෝ ඒ යෞවනයාගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ හෝ භාරකරුගේ හෝ ඒ යෞවනයා, වැඩ කිරීමට අදහස් කරන පතලේ කළමනාකරුගේ හෝ ඉල්ලීම පිට, වෛද්‍ය නිලධරයා විසින් ඒ යෞවනයා පරීක්ෂා කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා වයස අවුරුදු දහසය සම්පූර්ණ කර ඇති බවට සහ පතලක සම්පූර්ණ දිනයක වැඩ කිරීම සඳහා ඔහු යෝග්‍ය බවට ඒ වෛද්‍යවරයා සෑහීමට පත් වන්නේ නම්, ඒ අනුව යෝග්‍යතා සහතිකයක් ඒ වෛද්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) වයස අවුරුදු දහසයකට වැඩි, කිසිම යෞවනයකු, ඒ යෞවනයා වෙනුවෙන් නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකයක් පතලේ කළමනාකරු වෙත භාරදී තැන්පත් කරනු ලැබ ඇත් නම් මිස, පතලක වැඩ නොකළ යුතු ය ; නැතහොත් එසේ වැඩ කිරීමට යොදවා ගැනීම හෝ අවසර දීම නොකළ යුතු ය.

(5) වයස අවුරුදු දහසයකට වැඩි යෞවනයකු කම්කරුවකු ලෙස යොදවා ගනු ලබන අවස්ථාවේ දී, (4) වන උපවගන්තිය යටතේ තැන්පත් කරන ලද යෝග්‍යතා සහතිකය පිළිබඳව සඳහන් කිරීමක් අඩංගු සංකේතයක්, පතලෙහි කළමනාකරු විසින් ඒ යෞවනයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) වයස අවුරුදු දහසයකට වැඩි කිසිම යෞවනයකු, (5) වන උපවගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කරන ලද සංකේතය, ඔහු වැඩ කරන වේලාවේ දී තමා වෙත තබාගෙන සිටින්නේ නම් මිස, පතලක වැඩ නොකළ යුතු ය ; නැතහොත් එසේ වැඩ කිරීමට ඔහුට අවසර දෙනු නොලැබිය යුතු ය.

(7) පතලක වැඩ කරන, වයස අවුරුදු දහසයකට වැඩි යම් යෞවනයකු කාර්යාංශය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ යම් නිලධරයකුගේ මෙහෙයවීම පිට, ඕනෑම අවස්ථාවක දී වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය ; තව ද ඒ පරීක්ෂණය මත, පතලෙහි වැඩ කිරීම සඳහා ඔහු තවදුරටත් යෝග්‍ය නොවන බව පෙනී ගියහොත්, වෛද්‍ය නිලධරයා විසින් ඒ යෞවනයාගේ යෝග්‍යතා සහතිකය, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ යෝග්‍යතා සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ, වයස අවුරුදු දහසයකට වැඩි සෑම යෞවනයකු ම, පතලේ කළමනාකරු විසින්, වහාම සේවා නියුක්තියෙන් මුදා හරිනු ලැබිය යුතු ය.

යෞවනයකු වැඩ කළ යුතු පැය ගණන.

57. (1) වයස අවුරුදු දහසයකට වැඩි කිසිම යෞවනයකු කිසිම පතලක රාත්‍රී කාලය තුළ දී වැඩ නොකළ යුතු අතර, එසේ වැඩ කිරීමට ඔහුට අවසර දෙනු නොලැබිය යුතු ය.

(2) යම් දිනයක දී ආහාර ගැනීම සහ විවේකය සඳහා එක් පැයක් ඇතුළුව අනුගාමී පැය අටකට වැඩියෙන් හෝ යම් අනුගාමී දින හයක් තුළ පැය හතළිස් හතරකට වැඩියෙන් හෝ පතලක පොළොව යට වැඩ කිරීමට, වයස අවුරුදු දහසයකට වැඩි කිසිම තැනැත්තකුට නියම කිරීම හෝ බල කිරීම නොකළ යුතු ය.

(3) යම් එක් දිනයක් සඳහා (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම පැය ගණන යම් පතලක ඒ වන විටත් ඒ දිනයෙහි වැඩ කර ඇති, වයස අවුරුදු දහසයට වැඩි කිසිම යෞවනයකුට වෙනත් යම් පතලක වැඩ කිරීම හෝ වැඩ කිරීමට අවසර දීම හෝ නොකළ යුතු ය.

වැඩිහිටියන් වැඩ කළ යුතු පැය ගණන.

58. (1) යම් දිනයක දී ආහාර ගැනීම හා විවේකය සඳහා එක් පැයක් ඇතුළුව, කිසියම් දිනක අනුගාමී පැය අටකට වැඩියෙන් හෝ යම් අනුගාමී දින හයක් තුළ පැය හතළිස් අටකට වැඩියෙන් හෝ පතලක පොළොව යට වැඩ කරන ලෙස කිසිම වැඩිහිටි කම්කරුවකුට නියෝග කිරීම හෝ බල කිරීම හෝ නොකළ යුතු ය.

(2) වැඩිහිටි කම්කරුවකු යම් එක් දිනයක් සඳහා (1) වන උප වගන්තිය මගින් නියම කර ඇති උපරිම පැය ගණන, වෙනත් යම් පතලක එවකටත් වැඩ කර ඇති දිනයක දී වෙනත් යම් පතලක එදිනම වැඩ කිරීම හෝ එසේ කිරීමට ඔහුට අවසර දීම නොකළ යුතු ය.

බැසීමට සහ නැගීමට ගත කරන කාලය.

59. මේ පනතේ කාර්ය සඳහා, කම්කරුවකු විසින් පතලකට බැසීමට සහ එයින් නැගීමට ගත කරන කාලය, පතලේ පොළොව යට වැඩ කිරීම සඳහා ගත කළ කාලය ලෙස සලකනු ලැබිය යුතු ය.

සනීපාරක්ෂක සහ වෛද්‍ය උපකරණ.

60. (1) එක් එක් පතලෙහි කම්කරුවන්ගේ පාවිච්චිය සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි ප්‍රමිතිවලට සහ පරිමිතවලට අනුකූලව—

(අ) බීමට සුදුසු ජලය සැපයුමක් සහ සේදීම සඳහා ජලය ;

(ආ) වැසිකිළි පහසුකම් ; සහ

(ඇ) පතුරු, වෙලුම් පටි සහ වෙනත් වෛද්‍ය අවශ්‍යතා සැපයුමක් සලසා තැබිය යුතු ය.

(2) කම්කරුවන් සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත කර ඇති සෑම පතල් පරිශ්‍රයක ම—

(අ) හදිසි අනතුරක දී ප්‍රථමාධාර ප්‍රතිකාර සැලසීමේ කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි ගිලන් මැසි, ඖෂධ සහ උපාංග යන උපකරණ සවිකර ඇති, නියම කරන ලද ප්‍රමිතිවලට අනුකූල විශේෂ කාමරයක් සලසා දී එය නඩත්තු කරනු ලැබිය යුතු ය :, තව ද

(ආ) නියම කරනු ලැබිය හැකි තත්ත්වයකට ප්‍රථමාධාර ප්‍රතිකාර පිළිබඳව පුහුණුව ලද, ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු, පතලෙහි භූමියට පහළින් යම් වැඩක් කර ගෙන යන සෑම වේලාවල දී ම රාජකාරියෙහි නිරතව සිටිය යුතුය.

පරිසරය පුරුදිම.

61. (1) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු, ඒ බලපත්‍රයෙන් බලය දී ඇති කටයුතු, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් ඒ කටයුතු කරගෙන යාම පිණිස නියම කර ඇති ප්‍රමිතිවලට සහ කාර්ය පටිපාටිවලට අනුකූලව කර ගෙන යා යුතු ය ; තව ද ඒ බලපත්‍රය ගවේෂණය කිරීම හෝ පතල් කැනීම හෝ සඳහා වන අවස්ථාවක, ඒ ගවේෂණය හෝ පතල් කැනීම හෝ කරගෙන යනු ලැබුවේ යම් ඉඩමක ද, ඒ ඉඩම, ඒ පනත හෝ මේ පනත මගින් නැතහොත් ඒ යටතේ නියම කර ඇති ආකාරයට, බලපත්‍රය දරන්නා විසින් යථා තත්ත්වයට සහ පුනරුත්ථාපනයට පත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, බලපත්‍රලාභියාට ඒ ඉඩමට ප්‍රවේශ වී ඒ බලපත්‍රයෙන් බලය දී ඇති කටයුතු එහි කරගෙන යාමට ඉඩ දෙන ලෙස කාර්යාංශය විසින් ඒ බලපත්‍රය අදාළ වන්නා වූ ඉඩමේ මතුපිට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියෙන් තමා වෙත පනවන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම, යම් ඉඩමක මතුපිට හිමිකරු, විසින් හෝ පදිංචිකරු විසින් පැහැර හරින අවස්ථාවක, කාර්යාංශය විසින් ඒ කාරණය අමාත්‍යවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් බලපත්‍රය අදාළ වන ඒ ඉඩම හෝ ඒ ඉඩම විෂයයෙහි යම් සම්බන්ධතාවක් හෝ පිළිබඳව වූ යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් එසේ පළ කරනු ලැබූ අවස්ථාවක, නියමයෙහි සඳහන් ඉඩම හෝ ඉඩම විෂයයෙහි සම්බන්ධතාව පොදු කාර්යයන් සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය යුතු අතර, එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

62. මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා—

"වැඩිහිටියා" යන්නෙන්, වයස අවුරුදු දහ අටක් සම්පූර්ණ කර ඇති තැනැත්තකු අදහස් වේ.

"දිනය" යන්නෙන්, මධ්‍යම රාත්‍රියෙන් ආරම්භ වන පැය විසිහතරක කාලයක් අදහස් වේ;

"කළමනාකරු" යන්න, පතලක් සම්බන්ධයෙන් යෙදෙන විට, ගෙවීමක් කරනු ලැබුව ද, නොලැබුව ද, ඒ පතලෙහි ප්‍රබල භාරය හා පාලනය දරන තැනැත්තා ඉන් අදහස් වේ;

"රාත්‍රිය" යන්නෙන්, සවස හත සහ උදෑසන හය අතර කාලය අදහස් වේ; තවද

"යෞවනයා" යන්නෙන්, වයස අවුරුදු දහහතර සම්පූර්ණ කර ඇති එහෙත් වයස අවුරුදු දහ අට සම්පූර්ණ කර නොමැති තැනැත්තකු අදහස් වේ.

## IV වන කොටස

### සාමාන්‍ය කරුණු

වැරදි.

63. (1) (අ) මේ පනත යටතේ ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව, ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා ගවේෂණය කරන හෝ පතල් කණින හෝ ඒවා සකස් කරන, ප්‍රවාහනය කරන, වෙළෙඳාම් කරන හෝ අපනයනය කරන;

(ආ) යම් ඛනිජ ද්‍රව්‍යයක් වෙළෙඳාම් කිරීම සඳහා මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන තැනැත්තකු නොවන තැනැත්තකු ගෙන් දැන දැනම ඒ ඛනිජ ද්‍රව්‍ය මිලට ගන්නා ;

(ඇ) මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධ යෙන් දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් හෝ වංචනික කරුණු දැක්වීමක් හෝ කරන ;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍ර යක් දරන්නකුව සිටියදී, ඒ බලපත්‍රයෙන් අවසර දී ඇති කටයුතු කර ගෙන යාමේ දී, ඔහු විසින් සොයා ගන්නා ලද ඛනිජ ද්‍රව්‍ය කිසිවක් සොයා ගැනීම පිළිබඳව කාර්යාංශ යට දැනුම් දීම පැහැර හරින

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්ලක්ෂ යක් නොඉක්මවන දඩයකට සහ දෙවන හෝ තදනන්තර වර දක් සම්බන්ධයෙන් වන විට රුපියල් එක් මිලියනයක් නොඉක් මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) (අ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකුව සිටිය දී—

(i) මේ පනත මගින් හෝ එය යටතේ ඔහු විසින් පවත්වාගෙන යනු ලැබීමට නියමිත යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පවත්වා ගෙන යාම පැහැර හරින ;

(ii) මේ පනත මගින් හෝ එය යටතේ ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබීමට නියමිත යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීම පැහැර හරින ;

(iii) අසත්‍ය බව තමා දන්නා ප්‍රකාශයක් එවැනි යම් පොතක, වාර්තාවක, වාර වාර්තාවක හෝ තොරතුරක ඇතුළත් කරන ;

(iv) එවැනි පොතක, වාර්තාවක, වාර වාර්තාවක හෝ තොරතුරක, වැදගත් වන්නා වූ විස්තර ඇතුළත් කිරීම වුවමනාවෙන් ම නොකර හරින ;

(ආ) කාර්යාංශයේ නිලධරයකු විසින් හෝ කාර්යාංශය විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් මේ පනත මගින් හෝ එය යටතේ ඒ නිලධරයා හෝ තැනැත්තා වෙත පැවරී ඇති යම් බලයක්, ඒ නිලධරයා හෝ තැනැත්තා විසින් ක්‍රියාත්මක කිරීමේ දී ඒ නිලධරයාට හෝ තැනැත්තාට අවහිර කරන හෝ ඊට මැදිහත් වන

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ කිසිම දඬුවමක් සඳහන් කර නොමැති මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

නියෝග.

64. (1) නියමිත යයි මේ පනතින් නියම කරනු ලැබූ හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත සංශෝධනය කිරීම.

65. මේ වගන්තියෙහි "ආඥාපනත" යනුවෙන් සඳහන් කරනු ලබන, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ ආඥාපනතේ 2 වන වගන්තියේ (5) වන හා (6) වන ඡේද ඉවත් කිරීමෙන් ;

(2) ඒ ආඥාපනතේ 63 වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් :—

"මුහුදු පතුල කැනීමට ඇති බලය සීමා කිරීම.

63. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ මුහුදු පතුල කැනීම සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් දරන තැනැත්තකු නොවන කිසිම තැනැත්තකු මුහුදු පතුල කැනීම නොකළ යුතු ය." ;

(3) ඒ ආඥාපනතේ 64 වන වගන්තියෙහි " මුහුදු වෙරළෙහි යම් ස්ථානයකින් " යන වචන වෙනුවට " යම් ස්ථානයකින් " යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ ආඥාපනතේ 67 වන වගන්තියෙහි " 62 වන වගන්තිය යටතේ " යන වචන හා ඉලක්කම්වල සිට " අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකි ය " යන වචන දක්වා වූ සියලු වචන හා ඉලක්කම් වෙනුවට " 62 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබ ඇති විට හෝ බල පත්‍රය දරන්නා විසින් විරෝධය පා ඇති කොන්දේසියකට යටත්ව ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇති විට හෝ 64 වන වගන්තිය යටතේ තහනමක් නිකුත් කරනු ලැබ ඇති විට, අතෘප්තියට පත් යම් තැනැත්තකුට අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකි ය. " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීම.

**66.** 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත, පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි " අධ්‍යක්ෂවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක " යන වචන වෙනුවට, " අධ්‍යක්ෂවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක හෝ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි " (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් " යන වචන හා ඉලක්කම් වෙනුවට " (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් හෝ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ පනතේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකුට, වෙරළ කලාපය ඇතුළත පිහිටි අක් වෙරළෙහි හෝ මුහුදු පතුලෙහි යම් කොටසක රැඳීම සඳහා අධ්‍යක්ෂවරයාගෙන් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකුගෙන් හෝ අවසර පත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවිය යුතු ය. " ;

(4) ඒ පනතේ 31 අ වගන්තියෙහි "වෙරළ කලාපය තුළ කිසිම තැනැත්තකුට" යන වචන වෙනුවට "වෙරළ කලාපය තුළ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන බලපත්‍රයක් දරන තැනැත්තකු නොවන කිසිම තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්.

ඛනිජ ද්‍රව්‍ය සඳහා බදු පැනවීම පිළිබඳව පළාත් සභා වලට ඇති බලය.

**67.** පළාත් ඇතුළත ඛනිජ ද්‍රව්‍ය සඳහා පතල් කැනීමේ අයිතිවාසිකම් වෙනුවෙන්, ඒ පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව විසින් පැනවිය හැකි බද්ද, ඒ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමෙහි ලා කැණින ලද ඛනිජ ද්‍රව්‍යවල දළ පිරිවැටුමේ වටිනාකමින් සියයට දශම පහක් නොඉක්මවිය යුතු ය.

ඉවත් කිරීම.

**68.** (210 වන අධිකාරය වූ) ගල්වලවල්, පතල් සහ ඛනිජ ද්‍රව්‍ය ආඥාපනත, (211 වන අධිකාරය වූ) ලුණු ආඥාපනත, 1968 අංක 46 දරන විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**69.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**70.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"නිධි" යන්නෙන්, භූ තාප නිධි සම්බන්ධයෙන් හැර, ඛනිජ ද්‍රව්‍යවල ස්වාභාවික සාන්ද්‍රණයක් අදහස් වේ;

"ගවේෂණය" යන්නෙන්, නිධියක ප්‍රමාණය නිශ්චය කිරීම සහ එහි ආර්ථික වටිනාකම තීරණය කිරීම අදහස් වේ;

"භූ තාප නිධි" යන්නෙන්, උණු ජලය බල ශක්තිය නිපදවීමේ මාර්ගයක් ලෙස උපයෝගී කර ගත හැකි ඛනිජ ජලය වේද නොවේද යන්න නොතකා උණු ජල නිධි අදහස් වේ;

"බලපත්‍රය" යන්නෙන්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ;

"බලපත්‍රලාභී" යන්නෙන්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"පතල් කැනීම" යන්නෙන්, ඛනිජ ද්‍රව්‍ය කිසිවක් අගැයීමේ හා ලබා ගැනීමේ කාර්යය සඳහා පෘෂ්ඨය තුළ, මතු පිට හෝ කරනු ලබන කැනීමක් අදහස් වේ;

"ඛනිජ ජලය" යන්නෙන්, වාණිජ පදනමක් මත ඛනිජ ද්‍රව්‍ය උකහාගත හැක්කේ යම් ජලයකින් ද, ඒ ජලය අදහස් වේ;

"ඛනිජ ද්‍රව්‍යය" යන්නෙන්, ඝන, දියර හෝ වායු ආකාරයෙන් පෘෂ්ඨය තුළින් හෝ යටින් හාරා ගත හැකි ස්වභාවිකව ඇතිවන ඛනිජ ද්‍රව්‍යයක් ද, එවැනි ඛනිජ ද්‍රව්‍ය අඩංගු ලෝපස් කිසිවක් ද, සකස් කිරීමෙන් ලබා ගන්නා ඒ ඛනිජ ද්‍රව්‍ය වල යම් නිෂ්පාදනයක් ද, අදහස් වන අතර, එයට දැව බත් සහ ලවණ ද ඇතුළත් වන නමුත් හයිඩ්රොකාබන් ඇතුළත් නොවේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ඛනිජ ද්‍රව්‍ය පිළිබඳ විෂයය පවරා ඇති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වේ;

"නියමිත" යන්නෙන්, නියෝග මගින් නියමිත බව අදහස් වේ;

"සකස් කිරීම" යන්නෙන්, ඛනිජ ද්‍රව්‍ය ඇඹරීම, සුදුසු තත්ත්වයට පත් කිරීම, සාන්ද්‍රණය කිරීම හෝ භෞතික, රසායනික හෝ වෙනත් ක්‍රියාවලියක් මූලික ආකාරයකට ඛනිජ ද්‍රව්‍ය පදම් කිරීම අදහස් වන නමුත්, උණු කිරීම සහ පිරිපහදු කිරීම ඊට ඇතුළත් නොවන අතර "සැකසීම" යන යෙදුම ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

"ලේකම්වරයා" යන්නෙන්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,100 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.